# 多言語情報コーナー　　（令和７年　７月号）

## 1. කසළ වර්ග වෙන් කිරීම පිළිබඳව ඇති යෙදුම "සන් ආරු" දැන් අන්තර්ජාලය මගින් භාවිතා කිරීමට හැකිවීම පිළිබඳව.

කසළ වර්ග කිරීමේ යෙදුම හෙවත් "සන් ආරු " යනු ජංගම දුරකථන යෙදුමක් වන අතර එය කසළ වෙන් කිරීම , බැහැර කිරීම ආදිය පහසුවෙන් සෙවීමට සහ කසළ එකතු කිරීමේ දින පිළිබඳව ඔබට දැනුම්දීම සිදුකරනු ලැබේ.

ජපන් භාෂාවට අමතරව, මෙම යෙදුම ඉංග්‍රීසි, සරල කළ චීන භාෂාව , වියට්නාම, ස්පාඤ්ඤ සහ නේපාල භාෂාවලින් ද ලබා ගත හැකිය, එබැවින් කරුණාකර එය භාවිතා කිරීමට වගබලා ගන්න.

එසේම, ජුනි මස 2 වන දින සිට, කසළ වර්ග කිරීමේ යෙදුම හෙවත් "සන් ආරු " දැන් අන්තර්ජාලය හරහා භාවිතා කල හැක.

එය ඔබට කසළ සහ ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ දින දර්ශනයක්, කසළ සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන් කර බැහැර කරන ආකාරය, කසළ සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි වර්ග කිරීමේ ප්‍රස්ථාරයක් සහ නගර කාර්යාල මගින් සිදුකරන දැනුම්දීම් වෙත ප්‍රවේශ වීමට ඉඩ සලසන පහසු යෙදුමකි, එබැවින් කරුණාකර එය භාවිතා කරන්න.

තවද, කසළ වෙන් කිරම සහ බැහැර කරන ආකාරය පිළිබඳ තොරතුරු ඉංග්‍රීසි, සරල කළ චීන, වියට්නාම, ස්පාඤ්ඤ, නේපාල යන භාෂාවලින් තොචිගි නගර ශාලාවේ සහ තොචිගි නගර ජාත්‍යන්තර සම්බන්දතා සංගමයේ වෙබ් අඩවිවලින් ලබාගත හැක.

ඉහත සඳහන් වෙබ් අඩවිවල ඔබට කසළ වෙන් කර බැහැර කරන ආකාරය, කසළ එකතු කිරීමේ දින දර්ශනයක් සහ කසළ වර්ග කිරීමේ යෙදුම "සන් ආරු " පිළිබඳ තොරතුරු නැරඹිය හැකිය, එබැවින් කරුණාකර ඒවා පරීක්ෂා කිරීමට වග බලා ගන්න.

## 2. රෙයිවා 8 වන වසර හෙවත් (2026) ළදරු පාසල් ආදියට ඇතුළත් කිරීම සහ ඒ සඳහා පෙර නැරඹුම් අවස්ථාව පිලිබඳව

රෙයිවා 8 වන වසර හෙවත් (2026)වසර සඳහා ළදරු පාසල්, සහතික කළ ළමාරක්ෂක මධ්‍යස්ථාන සහ කුඩා පරිමාණ ළමාරක්ෂක පහසුකම් සඳහා ඇතුළත් වීමට බලාපොරොත්තු වන අය සඳහා පෙර නැරඹුම් අවස්ථාවක් ලබාදෙනු ලැබේ .එබැවින් එම අවස්ථාව ලබාගැනීම සඳහා වගබලා ගන්න.

ඇතුළත් වීම සඳහා අයදුම්පත් සැප්තැම්බර් මාසයෙන් පසුව ආරම්භ කිරීමට නියමිතය. වැඩි විස්තර සඳහා, කරුණාකර නගරයේ වෙබ් අඩවිය තුලින් හෝ පෙර නැරඹුම් අවස්ථාවන් වලදී තොරතුරු ලබාගත හැකිය .

පොදු පාසල් වන "කුරනෝමචි", "ඕට්සුකා", "හකොනොමෝරි", "ඔහිරා නිෂි", "ඔහිරා මිනාමි දයි ඉචි ", "ෆුජියෝකා හාර්ට් රන්දෝ ", "සුගා යොට්සුබා" සහ "ඉවාෆුනෙ" යන පොදු දිවා සුරැකුම් මධ්‍යස්ථාන ජූලි 23 වන බදාදා ප.ව. 1:30 සිට පෙර නැරඹුම් අවස්ථාව ලබාගත හැක.

පෞද්ගලික සුරැකුම් මද්‍යස්ථාන, සහතික කළ ළදරු පාසල් සහ කුඩා පරිමාණ ළමාරක්ෂක පහසුකම් ඇති ස්ථාන සඳහා විවිධ පෙර නැරඹුම් දිනයන් ඇත, එබැවින් වැඩි විස්තර සඳහා කරුණාකර තොචිගි නගර ශාලාවේ වෙබ් අඩවිය පරීක්ෂා කරන්න.

මෙම පෙර නැරඹුම් අවස්ථාවට සහභාගී වන විට, කරුණාකර ගෘහස්ථ සපත්තු සහ ලිවීමේ උපකරණ රැගෙන යාමට වග බලා ගන්න.

### 3. ආපදාවකදී ඉවත් කිරීමේ ප්‍රධාන නවාතැන් පිලිබඳව

ව්‍යසනයකදී හැකි ඉක්මනින් පුද්ගලයින් ඉවත් කිරීමේ නවාතැන් අරම්භ කිරීම සඳහා, තොචිගි නගරයේ ඉවත් කිරීමේ මධ්‍යස්ථාන 23 ක් "ප්‍රමුඛතා ඉවත් කිරීමේ නවාතැන්" ලෙස සූදානම් වෙමින් පවතී.

මේ අතරින්, ඔහිරා ප්‍රජා මධ්‍යස්ථානයේ ඇති ව්‍යායාම ශාලාව භාවිතා කිරීම දුෂ්කර වී ඇති බැවින් මෙම මධ්‍යස්ථානය වෙනුවට මෙම වසරේ අප්‍රේල් මාසයේ සිට ඔහිරා කනිෂ්ඨ උසස් පාසල භාවිතා කරනු ලැබේ.

"ඉහත ප්‍රමුඛතා ඉවත් කිරීමේ නවාතැන්" විවෘත කළ විට, තොචිගි නගරය තුළ ඇති ජංගම දුරකථන වෙත හදිසි අනතුරු ඇඟවීමේ විද්‍යුත් තැපැල් ස්වයංක්‍රීයව යවනු ලබන අතර තොචිගි නගර වෙබ් අඩවියේ දැනුම්දීම් ආදිය පළ කරනු ලැබේ.

ප්‍රමුඛතා ඉවත් කිරීමේ නවාතැන් ඇතුළුව නගරය විසින් ඉවත් කිරීමේ නවාතැන් ලෙස නම් කරන ලද පහසුකම් "හදිසි ඉවත් කිරීමේ ස්ථාන" සහ "ඉවත් කිරීමේ ස්ථාන " ලෙස බෙදා ඇත. "හදිසි ඉවත් කිරීමේ ස්ථානයක්" සහ "ඉවත් කිරීමේ ස්ථාන " අතර වෙනස ඔබ දන්නවාද?
"හදිසි ඉවත් කිරීමේ ස්ථානයක්" යනු ආපදා තත්වයක් ළඟා වන විට තාවකාලිකව ඔබව ආරක්ෂා කිරීමට වෙන් වූ ස්ථානයකි.
තවද "ඉවත් කිරීමේ ස්ථානයක් " යනු ආපදා තත්වයකින් පසුව ඔබේ නිවසට හානි සිදුවී ඇති අතර ඔබට තවදුරටත් එහි ජීවත් විය නොහැකි වූ පසු යම් කාලයක් සඳහා ඔබට ජීවත් වීමට සලසා දෙනු ලබන ස්ථානයකි.
"හදිසි ඉවත් කිරීමේ ස්ථානය" හා " "ඉවත් කිරීමේ ස්ථානය" අතර වෙනස ඉතා හොඳි තේරුම් ගෙන සිටීම ඉතාමත් වැදගත් වේ.

ව්‍යසනයක් ඇති වූ විට, ඔබේ ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා "හදිසි ඉවත් කිරීමේ ස්ථානයකට " සඳහා ඔබ පැමිණෙන්නේ නම් සාමාන්‍යයෙන් ඔබ සිදුකලයුතු වන්නේ සෑම විටම ඔබ සඳහා අවශ්‍ය ආහාර පාන ඔබ රැගෙන යැම වේ.

දැනට ආරම්භවී ඇත්තේ  අධික වර්ෂාව සහ සුලිසුලන් ඇතිවියහැකි කාලයයි. එසේම, විශාල භූමිකම්පාවක් සිදුවන්නේ කවදාදැයි අපි නොදනිමු. හදිසි අවස්ථාවකදී ඔබට අපහසුතාවයක් නොවන පරිදි, ඔබට ඉතා ඉක්මනින් ලගාවිය හැකි ඉවත් කිරීමේ ස්ථාන කොතැනදැයි නිතිපතා පරීක්ෂා කිරීමට වග බලා ගන්න.

## 4. "තාවකාලික සිසිලන ස්ථාන" පිළිබඳ මාර්ගෝපදේශය　පිලිබඳව

තාප ආඝාතය හෙවත් අධික රස්නයෙන් ඇතිවන අපහසුතා වැළැක්වීම සඳහා, තොචිගි නගරය "තාවකාලික සිසිලන ස්ථාන" ලෙස තාවකාලිකව ඔබට සිසිල් බවක් ලබාගත හැකි ස්ථාන ආරම්භකර ඇත.

ඊට අමතරව, ජාතික රජය මගින් අනතුරුදායක තාප කාලය ලෙස නම්කර "විශේෂ තාප ආඝාත අනතුරු ඇඟවීමක්" නිකුත් කර ඇති විට, ඔබට නගරය විසින් නම් කරන ලද "සිසිලන නවාතැනක" රැකවරණය ලබා ගත හැකිය.

නගරයේ නම් කරන ලද පහසුකම් 128 ක් ඇති අතර උදාහරණයක් ලෙස, පොදු පහසුකම් ඇති ස්ථාන අතරට තොචිගි නගර ශාලා ප්‍රධාන ගොඩනැගිල්ල, ඔහිරා, ෆුජියෝකා, සුගා, නිෂිකතා සහ ඉවාෆුනෙ සාමාන්‍ය ශාඛා කාර්යාල, පුස්තකාල සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සහ සුභසාධන මධ්‍යස්ථාන ඇතුළත් වේ. පුද්ගලික පහසුකම් අතරට ඉයොන්, තොරිසෙන්, යෝර්ක් බෙනිමරු, වෙල්සියා, ෆැමිලි මාර්ට් සහ තැපැල් කාර්යාලය ඇතුළත් වේ. භාවිතා කළ හැකි ස්ථාන දැනගැනීම සඳහා, කරුණාකර තොචිගි නගර ශාලා වෙබ් අඩවිය හෝ පත්‍රිකා බලන්න.විස්තර පත්‍රිකා නගර ශාලාව, ප්‍රාදේශීය ශාඛා කාර්යාල සහ ප්‍රජා මධ්‍යස්ථානවල තබා ඇත. මෙම සේවාව ලබාගත හැකි කාලය ඔක්තෝබර් 22 දක්වා වේ.

කරුණාකර නම් කරන ලද පහසුකම් සපයන ස්ථානවල ඇති නීති රීති අනුගමනය කර තාප ආඝාතය වැළැක්වීම සඳහා වන "කුඩා සිසිල් ස්ථාන" හොඳින් භාවිතා කරන්න.